# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1996/47 - 2016 දෙසැම්බර් මස 09 වැනි සිකුරාදා - 2016.12.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත**

උතුරු පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී ධූරයක පුරප්පාඩු පිරවීම

උතුරු පළාතේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු මිය යාම හේතු කොට ගෙන එම පළාත් සභාවේ මන්ත්‍රී ධූරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65(1) වැනි වගන්තිය යටතේ උතුරු පළාතේ පළාත් සභාවේ ලේකම්වරයා විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත දන්වා තිබෙන හෙයින් ද ;

එකී පුරප්පාඩුව පුරවනු පිණිස තෝරා පත් කර ගත් මන්ත්‍රීවරයා අයත්ව සිටි පිළිගත් දේශපාලන පක්ෂය වන ඉලංකෙයි තමිල් අරසු කච්චි පක්ෂයේ ලේකම්වරයාට ඉහත කී පනතේ 65(2) වැනි වගන්තිය යටතේ සුදුසුකම් ඇති තැනැත්තෙකු නාමයෝජනා කරන ලෙස මැතිවරණ කොමිෂන් සභාව විසින් නියම කර ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයා විසින් එකී පුරප්පාඩුව පුරවනු පිණිස ආන්ඩියෙයා පුවනේස්වරන් මහතා නාමයෝජනා කර ඇති හෙයින් ද ;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනව වැනි සංශෝධනයේ විධිවිධාන සමග කියවිය යුතු 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ආන්ඩියෙයා පුවනේස්වරන් මහතා එම පුරප්පාඩුව සිදු වූ මුලතිව් පරිපාලන දිස්ත්‍රික්කයේ ඉහත සඳහන් පළාත් සභාවේ මන්ත්‍රීවරයකු ලෙස තේරී පත්වී ඇති බව මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

| | | |
|---|---|---|
| මහින්ද දේශප්‍රිය | සභාපති | මැතිවරණ කොමිෂන් සභාව |
| එන්. ජේ. අබේසේකර | සාමාජික | මැතිවරණ කොමිෂන් සභාව |
| එස්. රත්නජීවන් එච්. හූල් | සාමාජික | මැතිවරණ කොමිෂන් සභාව |

2016 දෙසැම්බර් මස 08 වැනි දින,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
රාජගිරිය.

12-1011